# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 438 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 12/03/2024 පැය 1300

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.03.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 38 | 220 | තඹ දඟර 02<br>බැරල් 02<br>ගෑස් ලිප් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.03.09 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බෙම්මුල්ල පොලිස් වසමේ බෙම්මුල්ල ප්‍රදේශයේ දී වැටලීම් 03 ක් සිදු කර **කේරළ ගංජා කිලෝ 10 ග්‍රෑම් 714 ක්, මන්නා පිහියක් හා කේරළ ගංජා ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ලද කැබ් රථයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන බෙම්මුල්ල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19 හා 22 වයස් වල පසුවන අවිස්සාවේල්ල හා පල්ලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. බෙම්මුල්ල** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නීති විරෝධි බීඩි කොල සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.03.11 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බෙම්මුල්ල පොලිස් වසමේ කලගෙඩිහේන ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධි බීඩි කොළ කිලෝ 2,499 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බෙම්මුල්ල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වූ කලගෙඩිහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. බෙම්මුල්ල** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර වැලි පටවමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.03.11 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සේරුනුවර පොලිස් වසමේ නීලපොල ප්‍රදේශයේ වැටලීම් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි පටවමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට ගෙන සේරුනුවර පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 22 ත් 45 ත් මුතූර්,** ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**